ශ්‍රී ලංකාවේ නීතියට අනුව, වයස අවුරුදු 16 ට අඩු අයෙකු බාලවයස්කාර දරුවෙකු හෝ දැරියක ලෙසින් හැඳින්වෙන අතර, ඔවුන් ලිංගිකත්වය සඳහා හෝ නීත්‍යානුකූල භාරකාරත්වයේ කැමැත්ත රහිතව තවත් අයෙකු සමඟින් පිටව යෑම වැනි කරුණක් සඳහා කැමැත්ත ලබාදීමට හැකි වයසක පසුවන්නේ යැයි නොසැළකේ.

එසේම, වයස අවුරුදු 16 ට අඩු බාලවයස්කරුවෙකු නීත්‍යානුකූල භාරකාරත්වයේ කැමැත්ත නොමැතිව ගෙන යෑම හෝ බාලවයස්කරුගේ කැමැත්ත සහිතව වුවද තමන් සමඟ යෑමට පෙළඹවීම, දණ්ඩ නීති සංග්‍රහයේ 352 වගන්තිය යටතේ අපහරණ වරදක් ලෙසින් සලකනු ලැබේ.

එවැනි පසුබිමක, ලුණුගල සූරියගොඩ ප්‍රදේශයේ 14 හැවිරිදි දැරියක උපකාරක පංති යන බව පවසා නිවසින් පිටව ගොස් අතුරුදන් වී, මාස 8 කට පසු පැලියගොඩින් මතුවී පොලිසිය මඟින් සොයාගැනීමේ සිදුවීම පුවත්පත් වාතර්ාවන් දෙකක (ජූලි 10, 2023) සිරස්තල ඔස්සේ වාතර්ා වී ඇති ආකාරය සලකා බැලිය හැක.

අරුණ - "ටියුෂන් මුවාවෙන් ගෙදරින් පැන්න කෙල්ල කොල්ලෙක් එක්ක පවුල් කාලා"

දිනමිණ - "ටියුෂන් ගිය දැරිය මාස අටකට පසු පැලියගොඩින් මතුවේ, පෙම්වතාත් අල්ලයි"

මේ අනුව,

1) අරුණ පුවත් සිරස්තලය ඔස්සේ, නීත්‍යානුකූල භාරකාරත්වයෙන් අපහරණය කිරීමට ලක්වූ බාලවයස් දැරියට, සිදුවීම සම්බන්ධයෙන් දෝෂාරෝපණය පැටවීමක් සිදුනොවන්නේ ද?

2) ඒ ඔස්සේ මෙවැනි සිදුවීම් වලදී වරදකරු අත ඇති වගකීම පිළිබඳ වඩා සැහැල්ලු ආකල්පයක් සමාජය වෙත ඉදිරිපත් නොවන්නේ ද?

3) එසේ නම් මෙම සිදුවීම පිළිබඳව වඩාත් යෝග්‍ය ලෙසින් දැක්වී ඇති සිරස්තලය ලෙසින් ඔබ තෝරාගන්නේ කුමක්ද?

මූලාශ්‍ර:
https://childprotection.gov.lk/.../Trafficking_Manual...

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධමර් කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!